Office of the Dean
RECEIVED
23 JUN 2025
Allied Health Sciences

# දැන්වීමයි

## මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය - 2023/2024

**-මෙහි සඳහන් සියලු උපදෙස් හොඳින් කියවා තේරුම් ගන්න-**

1) 2023/2024 අධ්‍යයන වර්ෂයට අදාල මහපොළ ශිෂ්‍යත්වලාභි සිසුන්ගේ නාම ලේඛනය ශිෂ්‍ය සුබසාධක අංශ වෙබ් අඩවියේ (welfare.sjp.ac.lk) පළ කර ඇත.

2) නාම ලේඛනයෙහි නම සඳහන් සියලුම සිසුන් (නම සඳහන් වුවත් **අධ්‍යයන වර්ෂ කල් ගත් සිසුන් ඇතුලුව**) ඒ සඳහා ලියාපදිංචි විය යුතු අතර ලියාපදිංචි වීමේ පෝරමය www.mahapola.lk යන වෙබ් අඩවියට පිවිස http://www.mahapola.lk/BankApp2024/ සබැඳිය හරහා ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය භාවිතා කිරීමෙන් ලබාගත හැකිය.

3) සම්පූර්ණ කරන ලද පෝරමය සෘජුවම (Online) මහපොළ අරමුදල වෙත **2025.06.30** දින හෝ ඊදිනට පෙර යොමු කළ යුතුය. (Online Submit කිරීම)

4) ඔබ බාගත කරන ලද ලියාපදිංචි වීමේ පෝරමයේ ඉහළ අධ්‍යයන වර්ෂය **2023 / 2024** ලෙස සටහන්ව තිබිය යුතු අතර එසේ සටහන්ව ඇත්දැයි හොඳින් බලන්න. එසේ නොමැති නම් නිවැරදි පෝරමය නැවත බාගත කරගන්න.

5) එම පෝරමයේ ඔබේ අත්සන යොදා ලියාපදිංචි අංකය පැහැදිලිව සටහන් කර විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සුබසාධක අංශය වෙත **2025.07.07** දින හෝ ඊදිනට පෙර ගෙනවිත් බාර දිය යුතුය. **(මහපොළ ශිෂ්‍යත්වලාභියා සතුවද පිටපතක් තබා ගැනීම අනිවාර්ය වේ).**

6) **බැංකු පාස් පොතේ පැහැදිලි ඡායා පිටපතක් හා ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්** ලියාපදිංචි වීමේ පෝරමය සමඟ අමුණා තිබිය යුතු අතර E - පාස්පොත් ඇති සිසුන් තම ගිණුමට අදාල බැංකුවෙන් ලබාගන්නා ලද **ලිපියක්** ඉදිරිපත් කළ යුතුය. (ඇමුණුම් සත්‍ය පිටපත් බව තහවුරු කිරීම අත්‍යවශ්‍ය නොවේ).

7) මෙම ගිණුම ශිෂ්‍යත්වලාභියාගේ නමට අයත් **ලංකා බැංකුවේ** හෝ **මහජන බැංකුවේ** ගිණුමක් විය යුතු අතර බද්ධ ගිණුමක් නොවිය යුතුයි.

8) ඔබ විසින් ලබා දෙන බැංකු ගිණුම් අංකය පසුව වෙනස් කළ නොහැකි අතර **සක්‍රීය ගිණුම් අංකයක්** ඉදිරිපත් කළ යුතුවේ. (Submit කිරීමට ප්‍රථම ගිණුම් අංකය නිවැරදි දැයි නැවත දෙවරක් පරික්ෂා කර බලන්න. Submit කළ පසු නැවත සංස්කරණය කළ නොහැක).

9) **ගිණුම් අංකය පසුව වෙනස් කරනු ලබන සිසුන්ගේ මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් මහපොළ ශිෂ්‍යත්වභාර අරමුදල විසින් අත්හිටුවනු ලබයි.**

නියෝජ්‍ය ලේඛකාධිකාරි/ ශිෂ්‍ය සුබසාධක අංශය
2025.06.19

**නියෝජ්‍ය ලේඛකාධිකාරි**
**ශිෂ්‍ය සුභසාධක අංශය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
**ගංගොඩවිල - නුගේගොඩ.**

Scanned with CamScanner